දිවි අහිමි කර ගැනීම් වාර්තා කිරීමේදී උපකාරක අංක සඳහන් කිරීම සඳහා මාධ්‍ය දිරිමත් කෙරෙන්නේ, ඒ ඔස්සේ දිවි අහිමි කර ගැනීමට නැඹුරුවක් ඇති තවත් අයකුගේ ජීවිතයක් බේරා ගැනීමට ඉඩ සැලසිය හැකි බැවිනි.

එසේම දිවි අහිමි කර ගැනීම සම්බන්ධ පුවත් වාර්තාවක් ඔස්සේ වක්‍රාකාරයෙන් සිදුවිය හැකි දිවි අහිමි කර ගැනීමට තවත් අයෙකුට වන පෙළඹවීම අවම කර ගැනීම උදෙසා, හැකිතාක් ප්‍රවේසම් සහගත ලෙසින් දිවි අහිමි කර ගැනීමේ පුවත් වාර්තා කරන ලෙස මාධ්‍යවේදීන්ව දිරි ගැන්වේ. දිවි අහිමි කර ගැනීම ප්‍රමුඛතාවය කින් යුතුව ඉදිරිපත් නොකරන ලෙසින් දැක්වෙන්නේද ඒ හෙයිනි.

මෙහිදී අපට නිරීක්ෂණය කළ හැක්කේ, සන්ඬේ ටයිම්ස් පුවත්පත මෙම ප්‍රවෘත්තිය අතිශයින්ම ප්‍රවේසම්කාරී ලෙසින් ඉදිරිපත් කොට ඇති බවයි. එහි සිරස්තලයේ මෙය දිවි අහිමි කරගැනීමක් බව සඳහන් නොවෙනවා සේම, ඒ බව අන්තර්ගතයේ පවා සඳහන්ව ඇත්තේ ප්‍රමුඛත්වයක් ලබා නොදෙමිනි. මෙය සැබැවින්ම ප්‍රශංසා කටයුතු වේ. එහි උපකාරක අංකයන්ද සඳහන් වූයේ නම් වඩාත් යහපති.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926
#MediaEthicsSL #lka #SinhalaPress #EnglishPress #News #SundayMawbima #SundayTimes